සැ. යු. - 2025.10.17 වැනි දින පළ කරන ලද අංක 2459 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,460 - 2025 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා - 2025.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1318 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බදුබාගිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1324 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | 1335 |


### සතිපතා නිකුත් වන *ගැසට් පත්‍රයෙහි* පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව ටයිප් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට සතියකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 නොවැම්බර් 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම 2025 ඔක්තෝබර් 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1317- B 082732 — (2025/10)
F 1 -

## තනතුරු - ඇබෑර්තු

### දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### 'ප්‍රාථමික - ශිල්පීය' සේවා ගණය සඳහා දෛනික පදනම මත සේවකයින් ලියාපදිංචිකර ගැනීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් සේවා අවශ්‍යතාවය සඳහා දෛනික පදනම මත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- රියදුරු - තනතුරු 03

ඒ අනුව පහත සඳහන් සුදුසුකම් සපුරලිය යුතුය. :

අධ්‍යාපන සුදුසුකම් : දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඕනෑම විෂයයන් 06 ක් සමත් වීම.

ශිල්පීය නිපුණතා : පුරප්පාඩුව පවතින බරවාහන පැදවීමට අදාළව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වරයා විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. මෝටර් රථ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වෙනත් සුදුසුකම් :

(1) ශ්‍රී ලංකා පුරවැසියකු වීම.

(2) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(3) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(4) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ වසර 05 ක අනුගාමී වසර 03 ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් අත්සන්කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

(5) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

බඳවා ගැනීමේ ක්‍රමය :

(1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරුකර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

(2) මෙය 2025.12.31 දිනය දක්වා පමණක් සේවය ලබා ගැනීම සඳහා පමණක් වීම.

(3) රා.ප.ච. 10/2025 අනුව PL 3 තනතුරට අදාළව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම.

අයදුම්පත් එවිය යුතු ආකාරය : මේ සමග සඳහන්කර ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතාකර සකස්කර ගත් අයදුම්පත් **2025 නොවැම්බර් මස 10** දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් ලිපි කවරයේ වම්පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන්කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

අයදුම්පත සමග එවිය යුතු ලේඛන : උප්පැන්න සහතිකයේ පිටපතක්/ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්/බර වාහන රියදුරු බලපත්‍රයේ පිටපතක්/අධ්‍යාපන සහතිකවල පිටපත්/පදිංචි සහතිකයේ පිටපතක්/වෘත්තීය සුදුසුකම් හා වෙනත් සුදුසුකම්වල දැක්වෙන සහතිකවල පිටපත්.

සුදුසුකම් සපුරා නොවැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

රුවන් වික්‍රමආරච්චි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

රියදුරු තනතුර සඳහා ලියාපදිංචිකර ගැනීමේ අයදුම්පත්‍රය

01. සම්පූර්ණ නම :...................................................................

02. මුලකුරු සමග නම :...................................................................

03. ජාතිය :....................................

04. පුද්ගලික ලිපිනය :...................................................................
...................................................................

05. දුරකථන අංකය :...................................................

06. උපන් දිනය :...................................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :...................................................

08. බර වාහන රියදුරු බලපත්‍රයේ අංකය :...................................................

බර වාහන රියදුරු බලපත්‍රය නිකුත්කර ඇති දිනය :...................................................

බර වාහන රියදුරු බලපත්‍රය කල්පිරී ඇති වසර ගණන :...................................................

09. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ ප්‍රතිඵල:...................................................
...................................................................
...................................................................
...................................................................

10. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ./පෙළ) විභාගයේ ප්‍රතිඵල:...................................................
...................................................................
...................................................................
...................................................................

11. පළපුරුද්ද :...................................................................
...................................................................

මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත්කර නොමැති බවටත් සහතික කරමි.

.........................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

10-304